# මෙල්බර්න් පුරවරයට පෑයූ "සුදු තාරකා"



තාක්‍ෂණය අති ධාවනයෙන් ඉදිරියට ඇදෙමින් පවතින මේ යුගයේ, පෙර නොවූ විරූ ආකාරයෙන් නොයෙක් මාදිලියේ නව නිර්මාණද පොකුරු පිටින් එළිදකිමින් තිබීම සතුටට කරුණකි. එක් එක් පුද්ගලයන්ගේ යටපත් වී, සැඟවී තිබූ සහජ කුසලතාවයන්, තවදුරටත් එසේ වැලලී තිබෙන්නට ඉඩ නොහැර, සවශක්තියෙන්ම තම හැකියාවන් ඔපමට්ටම් කොට ලොවට දායද කරන්නට, නව තාක්‍ෂණයෙන් ලැබෙනුයේ නොමඳ පිටුවහලකි.
එසේ එක දිගට කල එළි බසින නිර්මාණ අතුරින් සමහර නිර්මාණ ලෝකය තුළත්, හදවත් තුළත් අමරණීය ලෙස ලැගුම් ගන්නා අතරතුර, තවත් සමහර නිර්මාණ ඒවා යෙහි අන්තර්ගත විය යුතු ගුණයේ හා ආකර්ශන ශක්තියේ දුර්වලතාවය නිසා දෝ, නොදැනීම වාගේ වියැකී යනුද, පෙනෙන්නට තිබේ.

මේ දෙයාකාරයෙන්, තවත් දීර්ඝ ගමනකට මුල පුරන බවට සලකුණු හා සාධක අඩංගු සංගීත නිර්මාණයක් රස විඳීමේ අවස්ථාව මා හට පසුගිය දිනක අහඹු ලෙස අත් විඳින්නට ලැබුනේය. ඒ අප මෙල්බන් පුර-වරයේ බිහිවූ එක් අළුත් ගායිකාවක් වන ශ්‍රීපාලි එදිරිසිංහ විසින් ගීත ගායනා කරමින් එළිදක්වා ඇති ''සුදු තාරකා'' සංයුක්ත ගීත තැටියයි. මේ ගී තැටිය කල එළි බැස දැනටමත් ටික දිනක් ගෙවී ඇතත් මෙහි එන ගීත ශ්‍රවණය කිරීමට මට අවස්ථාව ලැබුනේ නොබෝ දිනකදීය.

සුදු තාරකා ගීත සමුච්චය මුල්වරට රසවිඳිමෙන් පසු නිරායාසයෙන්ම සිතෙහි ගොනුවුන අව්‍යාජ අදහස් කීපයක් සනිටුහන් කිරීමට මෙය අවස්ථාවක් කර ගත්තේ, මෙම සංගීත නිර්මාණයට දායක වී ඇති සියළුම ශිල්ප ශිල්පිණියන්ගේ මත නොව, මෙම රටපුරා විසිරී සිටින මෙවැනි දක්‍ෂතා වලින් සපිරි අනිකුත් නිර්මාණශිලී කලාකරුවන්ටද, ධෛර්‍යයක්, මඟපෙන්වීමක් යම් පමණකට හෝ ලබාදීමේ අරමුණද ඇතිවයි.
ශ්‍රී ලංකාවේ සිටින ප්‍රවීන ගායක ගායිකාවන් හා සංගීත ශිල්පීන්, විශාල බර පැනක් දරමින් නිතර නිතර මෙරටට ගෙන්වා, සජීවී සංගීත ප්‍රසංග පැවැත්වීමට කටයුතු යෙදෙන්නේත්, සමහර අවස්ථාවල එක් අයෙකුට ඩොලර් 60-65 ක වැනි මුදලක් ගෙවමින් එම ප්‍රසංගවලට අතුරු සිදුරු නැතිව ගී රස ලෝලීන් ඇදෙන්නේත්, මව්බිමින් බැහැරව සිටියත් අප අපගේ සුපුරුදු සංගීතයට තවමත් එක සිතින් ඇලුම් කරන නිසා බව අමුතුවෙන් සඳහන් කළ යුතු නැත.
නිතර නිතර සවනක වැටෙන බටහිර සංගීතයෙන් මදකට බැහැර වී කණට හුරුපුරුදු සිංහල ගීතයක් ආස්වාදනය කරන්නට සිතුන මොහොතක, යට කී අයුරින්, සජීවීව මෙන්ම, සංයුක්ත තැටි, රූප රචනා කොට සංගීතය සම්මිශ්‍රණය කරන ලද කැරියෝකී ගී තැටි හා ගීත ඇල්බම් ආදිය හරහා ගීත රස විඳීමට ඇති ඉඩකඩ හා අවස්ථාවන් දැන් දැන් විරල නැත. එවන් වූ යුගයක එසේ ආනයනය කරන ලද ගීත ගොන්නට, මෙහිම වාසය කරන ගායක

## සුනේත්‍රා චන්ද්‍රකාන්ති ජයසුන්දර

වික්ටෝරියා

ගායිකාවන් කීපදෙනෙකුද එකතුව සිටීම සතුටට හේතුවන කරුණකි.

මෙහිදී මගේ මාතෘකාවට පාදක වන ශ්‍රීපාලි එදිරිසිංහත්, සුදු තාරකා සංයුක්ත ගී තැටිය, ශ්‍රී ලාංකික ගීත ප්‍රිය කරන රසික රසිකාවියන්ගේ දෙසවනට සුමිහිරි ආශ්වාදයක් රැගෙන එන සුවිශේෂී ගීත නිර්මාණ රැසක එකතුවක් බව සඳහන් කරන්නට මා පෙළඹෙන්නේ, එය ඇගේ පළමු ගී තැටිය වුවත්, එහි ගැබ්ව ඇති සාරවත් ගති ලක්ෂණ නිසාය.

නවක ගායක ගායිකාවකගේ මතු නොව ප්‍රවීණ ශිල්පී ශිල්පිණියකගේ හෝ නවතම ගීත එකතුවක් රස විඳීමට යාමේදී සමහර අවස්ථාවල ගීත 15 - 16 සංඛ්‍යාවකින් ගීත කීපයක් පමණක් සිතට කාවදින අතර, තවත් විටෙක, මීට පෙර අසා කනට පුරුදු වී ඇති නිර්මාණ තරමටම එම නව නිර්මාණ සාර්ථක වී නැති බව වැටහෙන අවස්ථාද, විරළ නොවේ. නැවත නැවත ඇසීමේදී ක්‍රමයෙන් රුචිකත්වය වර්ධනය වන ගීතද සමහර අවස්ථාවල අපි අත් විඳින්නෙමු.
නමුත් සුදු තාරකා ගීත සමුච්චය ගත් කළ එහි අන්තර්ගත ගීත වැඩි ගණනකම කුමන ආකාරයේ හෝ ආකර්ශන රසයක් ගැබ්වී ඇති බව මුල්වරට ශ්‍රවනය කිරීමේදීම දැනෙන්නට පටන් ගන්නා බව මා පවසන්නේ අතිශයෝක්තියක් ලෙස නම් නොවේ. ඇත්ත වශයෙන්ම එය කාටත් පොදුවේ රස විඳිය හැකි, හොඳ මට්ටමක පෝෂණ ගුණයකින් යුතු රසබර නිර්මාණ එකතුවකි. ගායනය, පද රචනා, තනු හා සංගීතය මෙන්ම උචිත ලෙස යොදාගත් තාක්‍ෂණයද ගීතවලට ඉමහත් සාධාරණයක් ඉටුකර ඇති බව ප්‍රකටවම පෙනේ. වරක් ඇසූ පසු තව වරක් ඇසීමේ රුචිකත්වයක් උපදවමින් අවසාන වන ආකාරයේ ගීත සමුදායකින් රසවත් වූ ''සුදු තාරකා'' මෙහි ප්‍රධාන ගායිකාවගේ මෙන්ම තවත් ශිල්පීන් කීපදෙනෙකුගේම කුසලතාවයන් රැසක එකමුතුවක් ලෙස හැඳින්විය හැකිය.
සිසිර දිසානායක, මහින්ද දිසානායක, ජගත් ජේ. එදිරිසිංහ ආදී පද රචකයනගේ ගී පදමාලාව, අරුත් බර බවින් හා විවිධ රසයෙන් යුක්තව, දෙසවනට කථා කරන ආකාරයේ නිර්මාණවීමද මෙහි ඇති තවත් විශේෂත්වයකි.
සංගීත විෂයය පිළිබඳව හසල දැනුමක් මා තුළ නැතත්, ශ්‍රීපාලි එදිරිසිංහගේ ගායන හැකියාව ගායන ශෛලිය, ගායනයට උචිත ශ්‍රීපාලිගේ මුවහත් කටහඬ මේ සියළුම ගීතවල සාර්ථකත්වයට මූලික වූ ප්‍රධාන හේතුවක් බව මා නොබියව ප්‍රකාශ කරමි.
එසේම පද රචනා, සංගීතය, ගායනය හොඳ මට්ටමක තිබියදී ගීතයකට යොදන තනුව උසස් වුවත්, එය ආකර්ශනීය නොවන විට, එම ගීත අසන්නන් අතර ජනප්‍රිය වන්නේ නැත. එසේ ජනප්‍රිය නොවී වැළලී යන උසස් මට්ටමේ ගීත ඕනෑ තරම් තිබේ. මෙසේ අනිකුත් අවශ්‍ය සාධක සම්පූර්ණව තිබියදී, නිපදවන ගීතයකට රසවත් තනුවක්ද යෙදෙන්නේ නම්, එය සංගීත ශ්‍රාවකයන් නො-අනුමානවම ආදරයෙන් වැලඳ ගන්නා නිර්මාණයක් වනු නිසැකය.

ශ්‍රීපාලි එදිරිසිංහගේ කුළුඳුල් ගීත නිර්මාණයට, ශ්‍රී ලංකාවේ ප්‍රවීන තනු නිර්මාණ ශිල්පීන්ට අමතරව, ක්‍රිස්ටෝපර් බණ්ඩාර, ජගත් ජේ. එදිරිසිංහ ආදී දක්‍ෂතා සපිරි සංගීත ශිල්පීන් විසින් සපයා ඇති විවිධ රස සංකලනයකින් සමන්විත වූ ගී තනු මෙහි සාර්ථකත්වයට සුවිශාල මෙහෙවරක් කර ඇති බවද විශේෂයෙන් කැපී පෙනෙන ලක්‍ෂණයකි. එය මෙම ගායිකාව ලද භාග්‍යයක් සේ සැලකිය හැකිය.
නිදර්ශන ලෙස ජගත් ජේ එදිරිසිංහ විසින් පද රචනය කොට තනු සපයා නිර්මාණය කළ ''පිණි බිඳක් සැලුනා'' ගීතයත්, සිසිර දිසා-නායක පද රචනයෙන්ද, ක්‍රිස්ටෝපර් බණ්ඩාර තනු නිර්මාණයෙන්ද දායක වී ඇති ''කාගේ කවුද කියා'' ගීතයත් ගෙන හැර දැක්විය හැක. නැවත නැවත ඇසීමේ රුචිය උපදවමින් මේ අයුරින් නිර්මාණය වී ඇති ගීත වැඩි සංඛ්‍යාවක් මේ සංයුක්ත තැටියේ අඩංගුව තිබීම අසන අපගේ භාග්‍යයට කරුණකි.

මෙම ගීතාවලියේ මා දකින තවත් සුවිශේෂී ගුණාංගයක් ලෙස දැක්විය හැක්කේ, යෞවන ආදරයට පමණක් සීමා වු තේමාවන්ටම සිර නොවී, විවිධත්වයකින් යුතු මාතෘකා ඔස්සේ ගී රචනා කර තිබීමත්, ඒවාට ගැලපෙන හා එකි-නෙකට වෙනස් ආකාරයේ රසවත් ගී තනු වලින් හා සංගීතයෙන් මෙම සියළුම ගීත පාහේ පෝෂණය කොට තිබීමත්ය.
''මල් පිපුණා වසන්ත කාලේ'', ''ඔබට හිමි නැති'', සේල පායාසේ, ''යන්නට ඔබ හට'' ආදී වශයෙන් ශ්‍රීපාලි විසින් ඇගේ විහිදෙන, සුමියුරු කට හඬින් මනා සංයමයකින් මුල, මැද, අග අපූරුවට පාලනය කරමින් ගායනා කර ඇති මෙම ගීතාවලිය, එක දිගටම වෙහෙ-සකින් තොරව අසාගෙන සිටිය හැකි මට්ටමක තිබීම ප්‍රශංසනීයය. අදහස ඉස්මතු වන ආකා-රයට පද ගලපා, රචනා කර ඇති ගීතවලට ශ්‍රීපාලි උපරිමයෙන් සාධාරණය ඉෂ්ඨ කර ඇත.
මෙවැනි දස්කම් සහිත තවත් බොහෝ අය ඕස්ට්‍රේලියාව පුරා සිටිනවාට සැකයක් නැත. අළුතින් ගී තැටි නිර්මාණය කිරීමේදී, මෙසේ විවිධ රසයෙන් පරිපූර්ණ වූ රසවත් පද රචනා, තේමා, සංගීතය හා තනු සම්මිශ්‍රණය කරමින් නිර්මාණශීලි සංගීත තැටි එළිදැක්වෙන්නේ නම්, ලංකාවෙන් මෙරටට අප ගී තැටි ආනයනය කරනු වෙනුවට, මෙරටින් ලක්බිමට ගී තැටි ගෙන්වා ගැනීමට එහි සිටින ගීත ලෝලීන් උනන්දු වන දිනය වැඩි ඈතක නොවිය හැක.
මෙය මධ්‍යස්ථ විචාරයක් මිස, අනිකුත් ගායක ගායිකාවන් ගේ ගී හා තාල සංසන්දනය කිරීමක් නොවන බවද අවසාන වශයෙන් සටන් කිරීමට කැමැත්තෙමි.



---

27 පිටෙන්

සංජයගෙන් ලැබෙන ලිපි කෙටි වී ගිය අතර ලැබෙන කාල පරතරයද දුරස් වී ගියේය. වසර අවසානයේ විභාගය ලංව ඇති හෙයින් ඔහු මහන්සි වී පාඩම් කරනවා ඇත. ඇය සිතින් ඔහුට ජය පැතුවාය. ඉඳහිට මිතුරියන්ගෙන් ලැබෙන ලිපි වලටද ඇය කෙසේ හෝ පිලිතුරු සැපයුවාය.

දෙමව්පියන්ගෙන් සති පතා ලැබෙන දුරකථන ඇමතුම් හා මිතුරු මිතුරියන්ගෙන් ලැබෙන ලිපි මේ නුහුරු නුපුරුදු රටේ හුදකලාවෙන් මිදීමට යම් තරමකට හෝ දායක විය.

දිනක් ඇය දවල් කාලයේ නවාතැනෙන් පිට වූයේ දේශන පැවතුනේ සවස් වරුවේ පමණක් හෙයිනි. බියන්කාද එවෙලේ නගරයට යාමට සූදානම්ව සිටි බැවින් නිමාලිකාටද ඇගේ රථයෙන් යාමට ඇර-යුම් ලැබිණ. රිය ගරාජයෙන් පිටතට ගනිද්දීම තැපැල් කරු පැමිණ ලිපි කිහිපයක් ලියුම් පෙට්ටියට දමා ගියේය. නිමාලිකා දුව ගොස් ලියුම් පෙට්ටියට එබී බැලුවාය. ඇගේ සිත සතුටින් පිරිණ.

මාස ගානකට පස්සෙ මදුෂානිගෙන් ලිපියක්. කලින් ලිපියට උත්තර ලියන්න මදැයි ගත්ත කල්.. ඇය සිතින් සිතමින් ලිපිය පොත් අතර රුවා ගත්තාය. බියන්කා නිමාලිකාව සරසවියේ ප්‍රධාන දොරටුව අසලින් බස්සවා ගියාය.

නිමාලිකා විද්‍යා ගොඩනැගිල්ලට ඇතුළු වී කොරිඩෝරය දිගේ මද දුරක් ගොස් නැවතී කුළුණකට උර දී පොත තුල වූ ලිපිය අතට ගත්තේ දේශන ශාලාවට යාමට තව වෙලාව තිබෙන හෙයිනි. ලිපිය තරමක් දුර කියවා ගෙන යද්දී ඇගේ දෙපා අප්‍රාණික වී ගෙන ගියේය.

මං දන්නව උඹ මේක අහපු ගමන් අප්සෙට් ගහන බව. හිතට දැහිරිය ගනින්. සංජය දැන් ටික කාලෙක ඉඳල කැම්පස් එකේ කෙල්ලෙක් දක්කනව. මාව දැක්කම මග ඇරල යනව. සුනෙත් නං අහල තියෙනව කෙලින්ම. එතකොට කිව්වලු රට ගිය කෙල්ලො විශ්වාස කරන්න පුළුවන් කාටද කියල. සුනෙත් හොඳවයින් දෙක තුනක් කියල ආවලු.. ඇයට ඉතිරි ටික කියවා ගත නොහැකි විය. කාගේදෝ ඇගේ හැපී නොහැපී එලියට බැස සරසවි බිම මැදින් ඈතට දිව ගියාය. ගඟ අද්දර වූ බංකුවක වාඩිවී ඉකි ගසමින් හඬන්නට පටන් ගත්තාය.

කිසිවෙකු තමා අසලට එනු දැනී හිස ඔසවා බැලූ ඇයට දුක්බර දෑසින් ඇය දෙස බලා සිටින හෂාන්ගේ මුහුණ බොඳවූ සිත්තමක් ලෙස පෙනුණි.

අඬන්න එපා නිමාලිකා. මාව දකින එකත් ඔයාට කරදරයක් නම් මම වෙන කැම්පස් එකක කෝස් එකකට මාරු වෙන්නම්. මටත් මේ දුක හැමදාම විඳින්න බෑ..

ඔහු යන්නට හැරුණි. හැඩුම් අතරින් හිස දෙපසට සෙලවූ නිමාලිකා අත රැ ඳි පොඩි වී ගිය ලිපිය ඔහු අත තැබුවාය. ඉන්පසු දෑතින් මුහුණ වසා ගෙන වේගවත්ව එන ඉකි ගැසුම යටපත් කර ගන්නට වෙර දැරුවාය. සෙමින් බංකුවේ කොනකින් වාඩි වූ හෂාන් එක අතක් තම උරහිස මත තබනු නිමාලිකාට දැනුණි. ඇය ඒ අත ඉවත් කිරීමට හෝ එතැනින් නැගිට යාමට හෝ උත්සාහ නොකලාය. බොහෝ වේලාවක් ඒ අයුරින්ම සිටියාය.

දැන් ඇති ඇඬුව. ඉතින් අපි යමු.. හෂාන් නැගී සිටියේය. සැඳෑ සෙවනැලි ගලා එන අඳුරින් මැකී යද්දී ඔවුහු නිහඬව සරසවි බිම දිගේ ඇවිද ගියෝය.

හඬන්න මිහිරිය මා උරපතු මත ඔබෙ සිත ඉන් සැනසේ නම්...

ශ්‍රියා කුමාරසිංහ